**Trial Monitoring report (නඩු විභාග අධීක්ෂණ වාර්තාව)**

**About the case (කුමන නඩුවක් සම්බන්ධයෙන් ද):** වනාතවිල්ලුව ලැක්ටෝවත්තෙහි පුපුරණ ද්‍රව්‍ය සොයාගැනීම හා සබැඳි නඩුව

**Case no (නඩු අංකය):** PUTTLAM /TAB 107/2021

**Courts (අධිකරණය):** පුත්තලම මහාධිකරණය

**Date of hearing (නඩුව අසන ලද දිනය):** 2023 ජනවාරි මස 24 වන දින

**Author (s) of report (වාතර්ාවේ කතෘ හෝ කතෘන්):** නීතිඥ මනුෂිකා කුරේ.

**1. Who was in courts:**

| **Who** | **Names / other information** | **Comments** |
|---|---|---|
| **Judge (s) (විනිසුරු හෝ විනිසුරුවරුන්)** | විනිසුරු නිශාන්ත හපුආරච්චි මහතා, විනිසුරු හසිත සමන් පොන්නම්පෙරුම මහතා සහ නයෝමි වික්‍රමසේකර විනිසුරුතුමිය | |
| **Attorney General's Dept. (නීතිපති දෙපාතර්මේන්තුව)** | නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් වසන්ත පෙරේරා,<br>රජයේ නීතිඥ උදාර කරුණාතිලක | |
| **Police (CID / TID etc.) (පොලීසිය - අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව/ත්‍රස්ත විමශර්න ඒකකය/ වෙනත්)** | - | |
| **Accused / Suspects (චූදිත/ සැකකරුවන්)** | 1. අබූ හනීෆා මොහොමඩ් මුෆිස් හෙවත් මුෆිස් හෙවත් අබූ දහිදා<br>2. අමීර් හම්සා මොහොමඩ් හමාස් හෙවත් හමාස් හෙවත් අබූ සාෆියා<br>3. මොහොමඩ් සරීෆු ආදම් ලෙබ්බේ හෙවත් ගෆූර් මාමා හෙවත් ගෆූර් නානා හෙවත් අබූ හදීද්<br>4. මොහොමඩ් ඊබ්‍රහිම් සාදික් අබ්දුල්ලා හෙවත් සාදික් හෙවත් සාදික් අබ්දුල්ලා හෙවත් අබූ උමර්<br>5. මොහොම්මදු ඊබ්රහිම් මොහොම්මදු නවුෆර් හෙවත් නවුෆර් මවුලවි හෙවත් අබූ සෙයිද්<br>6. මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිද් හෙවත් සාජිද් මවුලවි හෙවත් අබූ නජා | |
| **Lawyers for accused / suspects (චූදිතයන් / සැකකරුවන් වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | 1, 2 සහ 4 චූදිතයන් වෙනුවෙන් නීතිඥ රිස්වාන් උවයිස් මහතා සහ නීතිඥ වසීම් අක්‍රම් මහතා පෙනී සිටින ලදී.<br><br>3 වන චූදිත වෙනුවෙන් රජයෙන් පත් කළ නීතිඥ ඒ.එච්.එම් අල්තාෆ් මහතා පෙනී සිටින ලදී.<br><br>5 වන චූදිත වෙනුවෙන් රජයෙන් පත් කළ අද්නාන් ෆසාල් මහතා පෙනී සිටින ලදී. | |

| | | |
|---|---|---|
| | 6 වන චූදිත වෙනුවෙන් ගසාලි හුසේන් මහතා සහ නීතිඥ අස්හර් මහතා පෙනී සිටින ලදී. | |
| **Aggrieved party (අගතියට පත් පාශර්වය)** | - | |
| **Lawyers for aggrieved party (අගතියට පත් පාශර්වය වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | - | |
| **Supporters of accused / suspects (චූදිතයන්ගේ / සැකකරුවන්ගේ ආධාරකරුවන්)** | - | |
| **Supporters of aggrieved party (අගතියට පත් පාශර්වයේ ආධාරකරුවන්)** | - | |
| **Others (වෙනත් අය)** | මාධ්‍යවේදීන්, බන්ධනාගාර විශේෂ කාර්ය බලකාය (මහාධිකරණ ශාලාවෙන් පිටත සිටියේය.), බන්ධනාගාර නිලධාරීන්, පොලිස් නිලධාරීන් | |

## 2. What happened in the court hearing (උසාවි විභාගයේදී සිදු වූ දේ)?

උදැසන නඩු කටයුතු ආරම්භ කරන ලද අවස්ථාවේදී 1,2 චූදිතයන් පැමිණි සිටි අතර 4,5,6 චූදිතයන්ව බූස්ස බන්ධනාගාරයෙන් ගෙනැවිත් තිබුණි. කෙසේ නමුත් 3 වන චූදිතව මහර බන්ධනාගාරයෙන් ගෙනැවිත් නොතිබුනී. ඒ සියල්ල විමසා බැලූ විනිසුරුතුමන් පහත නියෝගය කරන ලදී.

“03 වන චූදිත මහර බන්ධනාගාරය මඟින් මේ වනතෙක් අධිකරණයට ඉදිරිපත් කර නැත.

වහාම මෙම චූදිත පැය කිහිපයක් ඇතුලත මෙම අධිකරණයට ඉදිරිපත් කළ යුතු බවට බන්ධනාගාර අධිකාරී, මහර වෙත දුරකථනයෙන් දැනුම් දීමටත්, එම නොසැලකිලිමත් පැහැර හැරීම සම්බන්ධව නිදහසට කරුණු විමසනු වස් බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ට නියෝග කරමි.

තවද මෙම නඩුව විශේෂිත ත්‍රිපුද්ගල මහාධිකරණ නඩුවක් වන අතර මෙම නඩුව සම්බන්ධයෙන් කඩිනමින් විමසීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය අවධානය යොමු කර තිබෙන අතර විශේෂයෙන් ත්‍රස්තවාදී කටයුතු සම්බන්ධයෙන් වන නඩු කටයුතු කඩිනමින් විසඳා යුතු බවට අධිකරණ සේවා කොමිෂන් සභාවේ චක්‍රලේඛ නිකුත් කොට ඇත.

එවැනි ආකාරයක නඩු කටයුත්තක් පවත්වාගෙන යන අවස්ථාවක බන්ධනාගාර නිලධාරීන් නොසැලකිලිමත් ලෙස කටයුතු කිරීම සම්බන්ධයෙන් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් අධිකරණයේ පෙනී සිටීමට නියෝග කරමි.

තවද නිදහසට කරුණු වාර්තා කිරීමට නියෝග කරමි.

අදාළ නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමට බන්ධනාගාරයට නියෝග කරමි.

ඒ අනුව මෙම නඩු කටයුත්ත අඩාලව කල් තැබීමට සිදු වනුයේ බන්ධනාගාර නිලධාරීන්ගේ නොසැලකිලිමත්භාවය බවට විශේෂයෙන් සටහන් කරමි.

ඒ අනුව 03වන චූදිත ගෙන්වූ වහාම අධිකරණ කටයුතු නැවත පවත්වාගෙන යාමට තීරණය කරමි.

දැන් වේලාව:පෙ.ව 10.45යි.

සාක්ෂිකරුවන්ට අවවාද.

අධිකරණ කටයුතු අඩාලව කල් තබමි.”

අධිකරණයේ එම අවස්ථාවේ සිටින ලද අනෙකුත් බන්ධනාගාර නිලධාරීන්ගෙන් ලැබුණු තොරතුරු අනුව අදාළ චූදිතව මහර සිට ගෙන ඒමට පැය තුනහමාරක පමණ කාලයක් ගතවන බව දැනගන්නට ලැබුණි. එම කරුණුද, ඉහත නියෝගය පිළිබඳවද මා විසින් මෙම නඩුව නිරීක්ෂණය කිරීම සඳහා මා යොමු කරන ලද ජ්‍යෙෂ්ඨ නීතිඥ මහතා වෙත දැනුම් දෙන ලදී. ඔහුගේ උපදෙස් මත ඒ අනුව මා අධිකරණ ශාලාවෙන් ඉවත්ව පැමිණෙන ලදී.

ඒ අනුව 3වන චූදිතව අධිකරණයට ගෙන්වූ පසුව අධිකරණයේ සිදු වූ කටයුතු පිළිබඳව නීතිඥ මහතකුගෙන් සහ මාධ්‍යවේදියකුගෙන් දුරකථනය හරහා විමසා දැනගතිමි. එලෙස ලද තොරතුරු අනුව පහත සටහන තබමි.

මෙදින සාක්ෂිකරුවන් තිදෙනෙකුගෙන් සාක්ෂි විමසා ඇත. එම එක් සාක්ෂිකරුවකුව ඇත්තේ, මාවනැල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු භාරගැනීම භාරව සිටි නිලධාරියාය. තවත් සාක්ෂිකරුවකු වී ඇත්තේ වෑන් රථය විකිණීමට අදාලව සිටි බ්‍රෝකර්වරයාය, අනෙක් සාක්ෂිකරු වී ඇත්තේ, උප පොලිස් පරීක්ෂක වික්‍රමරත්න මහතාය. ඔහු නඩු භාණ්ඩ සම්බන්ධයෙන් කටයුතු කළ පොලිස් නිලධාරියෙකි.

මෙම නඩුව නැවත 2023 වර්ෂයේ ජනවාරි මස 25 වන දින කැඳවීමට නියම කර ඇත.

**3. Any significant observations inside court room and outside? (උසාවි කාමරය තුළ සහ පිටත සැලකිය යුතු නිරීක්ෂණ තිබේද?) –**

**4. Next date & time (ඊළඟ දිනය සහ වේලාව):** 2023 ජනවාරි මස 25

**5. Media reports about the case on this date (මෙම නඩුව පිළිබඳ මාධ්‍ය වාර්තා):**